# කිරි වීදුරුව වැඩසටහන; ප්‍රගතිය හා අනාගත සළුලතා

රංජිත් ප්‍රේමලාල් ද සිල්වා
පී.ආර්. වීරක්කොඩි

**සංක්ෂේපය**

උපතේ සිට වසර පහ දක්වා දරුවන්ට කිරි මිල දී ගැනීම සඳහා මසකට රු. 200 බැගින් ලබාදීම "මහින්ද චින්තන" ප්‍රතිපත්තියේ එක් සංකල්පයකි. වයස මාස 24 ට වැඩි හා මාස 60 ට අඩු වයස් කාණ්ඩයේ පෝෂණ ඌනතාවයෙන් පෙළෙන අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් වෙත කිරි වීදුරුවක් ලබාදීම හරහා ප්‍රායෝගික තලයට පිවිසි මෙම සංකල්පය, 2009 වසරේ සිට දිවයිනපුරා ව්‍යාප්ත ව දියත් කෙරිණි. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් 2009 වසරේ නොවැම්බර් සිට දෙසැම්බර් දක්වා වූ දෙමස තුළ දී සිදු කරන්නට යෙදුණු මෙම කඩිනම් ඇගයීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දහයක් තෝරා ගැනිණි.

අධ්‍යයනයෙන් හෙළිදරව් වන පරිදි, කිරි වීදුරුවේ ක්‍රියාත්මක වැඩපිළිවෙළ ස්ථානීය වශයෙන් සරල හෝ සංකීර්ණ වූත්, උපදෙස් පිළිපැදීම අතින් විෂම වූත්, කිරි බෙදා හැරීමේ දුෂ්කරතාවලින් යුක්ත වූත් කර්තව්‍යයක් වූව ද අධ්‍යයන ප්‍රදේශවල සුදුසුකම් ලැබූ ප්‍රතිලාභීන්ගෙන් 45% ක් වෙත ප්‍රතිලාභ ලබාදීමට තරම් එය සමත් වී ඇත. එහෙත්, ප්‍රතිලාභීන් වෙත මසක දී කිරි ලබාදිය යුතු නියමිත දින ගණන තුළ අඛණ්ඩ ව හා සෞඛ්‍යාරක්ෂිත ව කිරි මි.ලී. 200 බැගින් ලබාදීම යනා දී වැඩසටහනේ ගුණාත්මක අගයන් තුළ සැලකිය යුතු වර්ධනයක් ළඟා කරගත යුතු ව ඇත.

කිරි වීදුරුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ගුණාත්මක ව හා ප්‍රමාණාත්මක ව තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා විවිධ පාර්ශවකරුවන් විසින් කිරි බෙදා හැරීම ආශ්‍රිත ව ඉස්මතු කරන ලද නානාප්‍රකාර ගැටලු සඳහා විසඳුම් ලබාදීම අත්‍යාවශ්‍ය වේ. මීට එක් විකල්පයක් ලෙස, කිරි බෙදාහැරීම ආයතනගත කිරීමේ උචිත ක්‍රමවේදයක් වශයෙන් පෙර පාසල් හරහා නියමු මට්ටමෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු බව යෝජනා කර ඇත. එමෙන් ම එහි සාර්ථකත්වය මත වෙනත් ප්‍රදේශ කරා වැඩසටහන ව්‍යාප්ත කිරීමත්, අදාළ රේඛීය ආයතනවල දායකත්වය ලබාගැනීම තුළින් ඉහළ ප්‍රමිතියෙන් යුතු කිරි සෞඛ්‍යාරක්ෂිත ව සැපයීමට පියවර ගැනීමත්, කිරි ගොවීන් දිරි ගැන්වීමේ හා නඟාසිටුවීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමත්, දැනුවත් කිරීමේ වැඩසටහන් හා අධීක්ෂණය හරහා වැඩසටහන ගුණාත්මක වශයෙන් වැඩි දියුණු කිරීමට පියවර ගැනීමත් අවශ්‍ය බව මෙම අධ්‍යයනයෙන් අවධාරණය කර ඇත.

## 1. හැඳින්වීම

දරුවන්ගේ පෝෂණය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී කිරි පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම සඳහා පියවර ගැනීම වැදගත් වේ. දරුවන් කිරි පරිභෝජනය සඳහා යොමු කරන වැඩසටහන් හුදෙක් පෝෂණමය කෝණයෙන් පමණක් නො සැලකිය යුතු අතර ම, එවැනි වැඩසටහන් කිරි වෙළෙඳපොළ සම්බන්ධයෙන් වූ අනාගත ආයෝජනයන් සේ සැලකිය යුතු ය. පාසල් දරුවන් වෙත කිරි බෙදාදීමේ වැඩසටහන් ලොව පුරා බොහෝ රටවල ව්‍යාප්ත වී ඇති බව Michael, (2005) පෙන්වා දී ඇත. සෑම වසරක ම සැප්තැම්බර් මස අවසාන බදාදා දිනය "ලෝක පාසල් කිරි දිනය" ලෙස නම් කර ඇති බව ඔහු තවදුරටත් සඳහන් කරයි. සමහර රටවල ඉහත කී වැඩසටහන්

අඩු ආදායම්ලාභී පවුල්වල ළමුන්ට පමණක් සීමා වී ඇත.

උපතේ සිට වසර පහ දක්වා දරුවන්ට කිරි මිල දී ගැනීම සඳහා මසකට රු. 200 බැගින් ලබා දීම "මහින්ද චින්තන" ප්‍රතිපත්තියේ එක් සංකල්පයකි (මහින්ද චින්තන, 2006). වයස මාස 24 ඉක්ම වූ සහ මාස 60 ට අඩු වයස් කාණ්ඩයේ අඩු ආදායම්ලාභී පවුල්වල පෝෂණ ඌනතාවයෙන් පෙළෙන දරුවන් සඳහා "කිරි වීදුරුවක්' ලබාදීමේ නියමු ව්‍යාපෘතිය හරහා මෙම සංකල්පය ප්‍රායෝගික තලයට පිවිසියේ ය. උක්ත නියමු ව්‍යාපෘතිය වර්ෂ 2006 දී සියඹලාණ්ඩුව, මඩුල්ල, රිදීමාලියැද්ද, මීගහකිවුල, කටුවන, සූරියවැව, කල්පිටිය, මුන්දලම, අඹගමුව හා ඇලපාත යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දහයේ දියත් කරන ලදී. ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ ළමා ලේකම් කාර්යාලයේ මෙහෙවීමෙන් 2009 වසරේ දී එය දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

වර්ෂ 2009 දී මෙම වැඩසටහන දිවයිනේ බොහෝ ප්‍රදේශයන් හි ක්‍රියාත්මක වී ඇති නමුත්, බිම් මට්ටමේ පවතින විවිධ දුෂ්කරතා හමුවේ එය දියත් කිරීම අභියෝගයට ලක් ව ඇති බව ළමා ලේකම් කාර්යාලය වෙත වාර්තා වී ඇත. මෙවැනි පසුබිමක් යටතේ, "කිරි වීදුරුව" වැඩසටහනේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ව අධ්‍යයනය කර එම වැඩසටහන සාර්ථක කරගත හැක්කේ කෙසේද? යන්න පිළිබඳව අවබෝධ කරගැනීම සඳහා අධ්‍යයනයක් දියත් කරනු ලැබූ අතර, එය පදනම් කරගනිමින් සකසා ඇති මෙම ලිපිය මඟින් එහි අත්දැකීම් පාඨකයන් හා හුවමාරු කරගැනීමට අපේක්ෂා කෙරේ.

## 2. අධ්‍යයන අරමුණු

මෙම ඇගයීමේ ප්‍රධාන අරමුණ වූයේ, ග්‍රාමීය මට්ටමේ දී "කිරි වීදුරුව" වැඩසටහනේ ක්‍රියාකාරීත්වය පිළිබඳ අධ්‍යයනය කර එම වැඩසටහනේ ඉදිරි ක්‍රියාකාරීත්වය සිදුවිය යුතු ආකාරය පිළිබඳ සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම වූ අතර, එහි සුවිශේෂ අරමුණු වූයේ; (අ) අපේක්ෂිත නිර්ණායකයන්ට අනුව "කිරි වීදුරුව" වැඩසටහන ක්‍රියාත්මක වන්නේ ද යන්න, විමසා බැලීම. (ආ) වැඩසටහනේ අපේක්ෂිත අරමුණු ඉටු වී ඇත්ද යන්න, විමර්ශනය කිරීම හා (ඇ) වැඩසටහනේ ගැටලු හා දුර්වලතා හඳුනාගෙන ඒවා මඟහරවා ගැනීමට උචිත යෝජනා ඉදිරිපත් කිරීම යි.

## 3. අධ්‍යයන ක්‍රමවේදය

ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ අභිමතය පරිදි විවිධ මට්ටමේ සාර්ථකත්වයෙන් යුතු ව "කිරි වීදුරුව" ක්‍රියාත්මක වන තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 10 ක මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

මිල්ලනිය, රත්නායකපුර, අඹගමුව, මුන්දලම, ඉමදුව, ඒරාවූර්, මොනරාගල, රිදීමාලියැද්ද, තඹුත්තේගම හා සූරියවැව එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වේ.

ඒ අනුව, "කිරි වීදුරුව" වැඩසටහන පිළිබඳ දත්ත රැස් කිරීම සඳහා ක්‍රමවේදයන් කීපයක් අනුගමනය කරන ලදී. "කිරි වීදුරුව" වැඩසටහනේ විවිධ පාර්ශවකරුවන්ගේ රැස්වීමක් කැඳවන ලද අතර, එම රැස්වීමට සහභාගි වූ ගම් මට්ටමේ ව්‍යාපෘතිය බාර ග්‍රාම/සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගෙන්, කිරි ගොවීන් හා කිරි බෙදා හරින්නන්ගෙන් ප්‍රශ්නාවලි ඇසුරෙන් දත්ත රැස් කරන ලදී. තව ද ප්‍රාදේශීය ලේකම්වරයා, සහ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩසටහන බාර නිලධාරියා සමග සම්මුඛ සාකච්ඡා පවත්වා ප්‍රදේශය තුළ වැඩසටහනේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තොරතුරු රැස් කරන ලදී. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ම ග්‍රාම නිලධාරී වසම් තුනක් හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් තෝරා ගන්නා ලද ප්‍රතිලාභීන් 816 දෙනෙකුගෙන් ව්‍යුහගත

ප්‍රශ්නාවලියක් ඇසුරෙන් දත්ත රැස් කරන ලදී.

## 4. "කිරි වීදුරුව" වැඩසටහනේ පාර්ශ්වකරුවන්ගේ දායකත්වය

ප්‍රාදේශීය ලේකම්වරයාගේ මඟපෙන්වීම හා මෑතක සිට සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) ගේ අධීක්ෂණය යටතේ විෂය බාර නිලධාරියකු විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මෙම වැඩසටහන දියත් කෙරේ. අධ්‍යයනයට ලක් කළ බොහෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල අදාළ විෂය බාර නිලධාරියා ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ නිලධාරියකු වූ අතර, වනිතා සංවර්ධන නිලධාරී, මුල් ළමාවිය සංවර්ධන සහකාර හෝ සහන සොයුරිය විසින් එම වගකීම දරන ලදී.


වඩාත් විශ්වාසනීය ලෙස මෙම වැඩසටහනට කිරි ගොවීන් හඳුන්වාදීමේ වගකීම පශු වෛද්‍ය කාර්යාලය සතු වුවත්, ඔවුන් දායක වී ඇති ආකාරය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව වෙනස් වී ඇත. මූලික රැස්වීමට සහභාගි වීම, කිරි ගොවීන් දැනුවත් කිරීමට සහාය වීම හා කිරිවල ප්‍රමිතිය පරීක්ෂා කිරීම ඒ ආකාරයන් ය. මෙම වැඩසටහනට ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා පවුල් සෞඛ්‍ය නිලධාරිණියගේ නිර්දේශය හා සෞඛ්‍ය වෛද්‍යවරයාගේ අනුමැතිය අත්‍යවශ්‍ය වේ. පෝෂණ ඌනතා සහිත දරුවන් හඳුනාගෙන මෙම වැඩසටහන වෙත යොමු කිරීම හා දරුවන්ගේ පෝෂණය පිළිබඳ ව දෙමාපියන් දැනුවත් කිරීමේ සිට වැඩසටහනේ ප්‍රගතිය විමසා බැලීම මෙන් ම දරුවන්ගේ පෝෂණ මට්ටමේ උච්චාවචන මත වැඩසටහනේ ප්‍රතිලාභීන් සංඛ්‍යාව යාවත්කාලීන කිරීම දක්වා වූ කාර්යයන් පවුල් සෞඛ්‍ය නිලධාරිණියගෙන් ඉටු කරගත හැකි වුව ද එවැනි පුළුල් හා ක්‍රමානුකූල සේවාවන් ලබා ගන්නා බවට කිසිදු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් වාර්තා නො වුණි. පවුල් සෞඛ්‍ය නිලධාරිණියගේ දායකත්වය ප්‍රතිලාභීන් හඳුනා ගැනීමට පමණක් සීමා වී ඇත.

ග්‍රාම නිලධාරීන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ගම් මට්ටමේ දී ප්‍රතිලාභීන් දැනුවත් කිරීමට හා හඳුනා ගැනීමට දායක වෙති. ආදායම් මට්ටම පිළිබඳ නිර්ණායකයන්ට අනුව, අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් වැඩසටහන වෙත යොමු කිරීමේ දී එම නිලධාරීන්ගේ නිර්දේශ අවශ්‍ය වේ. කිරි ගොවීන් හා බෙදාහරින්නන් "කිරි වීදුරුව" වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යවශ්‍ය අනුග්‍රාහකයෝ වෙති.

සමස්ත තියැදිය තුළ කිරි නිෂ්පාදනය හා බෙදාහැරීම, නිෂ්පාදනය පමණක් යන ආකාරවලින් ඔවුන් ලබාදෙන දායකත්වය ප්‍රස්ථාර අංක 1 න් ඉදිරිපත් කර ඇත.

**ප්‍රස්ථාර අංක 1**

**කිරි විදුරුව වැඩසටහනට ලබා දෙන දායකත්වය අනුව, කිරි ගොවීන්/ බෙදාහරින්නන්ගේ ව්‍යාප්තිය**





N = 119

මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර සමීක්ෂණය, (2009). හෙ.ගො.ප.පු. ආයතනය.

කිරි නිෂ්පාදනයෙන් පමණක් හෝ නිෂ්පාදනය හා බෙදා හැරීම යන දෙයාකාරයෙන් ම අනෙකුත් ප්‍රා. ලේ. කොට්ඨාස 8 තුළ මෙම වැඩසටහනට දායක වන කිරි ගොවීන් සංඛ්‍යාව 67 කි. එම කිරි ගොවීන් සතු දැනට කිරිදොවන දෙනුන් සංඛ්‍යාව මෙන් ම වියළි දෙනුන්, නැම්බියන් හා වැස්සී පැටවුන් සංඛ්‍යාව ඇතුළු පට්ටියේ මුළු ගවදෙනුන් සංඛ්‍යාව, මෙම වැඩසටහන සඳහා අඛණ්ඩ ව කිරි සැපයීමට ඇති හැකියාව මෙන් ම දරුවන්ට නියමිත කිරි මාත්‍රාව ලබා දීමට ඇති හැකියාව පිළිබඳ නිර්ණායකයක් වේ. අධ්‍යයන ප්‍රදේශවල වැඩසටහනට සම්බන්ධ කිරි ගොවීන් සතු ගව දෙනුන් පිළිබඳ දත්ත ප්‍රස්ථාර අංක 2 න් ඉදිරිපත් කර ඇත.

**ප්‍රස්ථාර අංක 2**

**කිරි ගොවීන් සතු ගව දෙනුන් පිළිබඳ තොරතුරු**




N = 119

මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර සමීක්ෂණය, (2009). හෙ.ගො.ප.පු. ආයතනය.

වර්තමානයේ දී එක් දෙනකගෙන් පමණක් දොවා ගන්නා කිරි සැපයීමෙන් වැඩසටහන හා සම්බන්ධ වී සිටින ගොවීන් සංඛ්‍යාව 23 (34%) ක් වන අතර, ඉන් හත්දෙනකු සතු එක ම දෙන ද ඇය යි. එනම්, මුළු කිරි ගොවීන් සංඛ්‍යාවෙන් 10% ක් වැඩසටහනට සම්බන්ධ වී ඇත්තේ දැනට කිරි දොවා ගන්නා එක ම දෙනගේ කිරි සැපයීමෙනි. මෙවැනි කිරි ගොවීන්ට වැඩසටහන සඳහා වසර පුරා අඛණ්ඩ ව කිරි සැපයීමටත්, දිනකට නියමිත කිරි මාත්‍රාව සැපයීමටත් දුෂ්කරතා තිබෙනු නො අනුමාන ය. තවත් කිරි ගොවීන් විසි දෙදෙනකු (33%) සතු ව දැනට කිරි දොවා ගත හැකි දෙනුන් දෙදෙනා බැගින් සිටින අතර, එම දෙනුන් දෙදෙනාගෙන් පමණක් ගව පට්ටිය සමන්විත වන කිරි ගොවීන් සංඛ්‍යාව අටකි. මේ අනුව, කිරි ගොවීන්ගෙන් 22% ක් පමණ ඉහත පරිදි කිරි සැපයුම අතින් අස්ථාවර වීමට ඇති ඉඩ ප්‍රස්ථා බහුල ය. සමහර අධ්‍යයන ප්‍රදේශවල දී මෙවැනි අස්ථාවර තත්ත්වයක් හේතුවෙන් නියමිත කිරි මාත්‍රාව ලබා නො දුන් අවස්ථා වාර්තා වී ඇත. තව ද කිරි ගොවීන්/බෙදාහරින්නන් බහුතරය (46%) දෙනුන් පස්දෙනෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සතු ගොවීන් වේ. දැනට කිරි දොවන දෙනුන් පස්දෙනෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සතු ගොවීන් සංඛ්‍යාව මුළු කිරි ගොවීන් සංඛ්‍යාවෙන් 10% කි.

කිරි විදුරුවට සම්බන්ධ කිරි ගොවීන්ගේ ගව පට්ටිවල විශාලත්වය පිළිබඳ තොරතුරු වගු අංක 1 න් තවදුරටත් පෙන්නුම් කෙරේ. ඒ අනුව ගව පට්ටිවල විශාලත්වය 1 සිට 25 දක්වා විචලනය වී ඇත. අඹගමුව, රිදීමාලියැද්ද හා ඉමදූව ප්‍රා. ලේ. කො. වලින් ගව පට්ටියේ අවම විශාලත්වය ද (1) සූරියවැවෙන් උපරිම විශාලත්වය ද (25) වාර්තා වී ඇත.

**වගු අංක 1**

**කිරි ගොවීන්ගේ ගවපට්ටි පිළිබඳ දත්ත**

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | දෙනුන් සංඛ්‍යාව | | | ගොවීන් සංඛ්‍යාව | පට්ටියේ විශාලත්වය මධ්‍යනය |
|---|---|---|---|---|---|
| | මුළු | අවම | උපරිම | | |
| තඹුත්තේගම | 5 | 5 | 5 | 1 | 5 |
| මිල්ලනිය | 33 | 4 | 7 | 6 | 5 |
| සූරියවැව | 37 | 12 | 25 | 2 | 18 |
| අඹගමුව | 64 | 1 | 7 | 24 | 3 |
| ඉමදූව | 33 | 1 | 7 | 8 | 4 |
| මොනරාගල | 101 | 2 | 15 | 17 | 10 |
| රිදීමාලියැද්ද | 43 | 1 | 21 | 6 | 7 |
| රස්නායකපුර | 32 | 4 | 23 | 3 | 10 |
| සමස්ත අගය | 348 | 1 | 25 | 67 | 5 |

මූලාශ්‍රයः ක්ෂේත්‍ර සමීක්ෂණය, (2009). හෙ.ගො.ප.පු. ආයතනය.

## 5. කිරි විදුරුව වැඩසටහනේ ක්‍රියාත්මක වැඩපිළිවෙළ

විෂය බාර නිලධාරීන් විසින් ඉහළ නිලධාරීන්ගේ මගපෙන්වීම යටතේ ග්‍රාමීය මට්ටමේ නිලධාරීන්ගේ දායකත්වයෙන් කිරි ගොවීන් හඳුනා ගනු ලැබේ. කිරි ගොවීන් කිරි බෙදාහැරීමට සූදානම්

නොමැති විට දී ඒ සඳහා සුදුසු බෙදාහරින්නන් හඳුනා ගනු ලැබේ. ඒරාවූර් ප්‍රදේශයේ දී සමෘද්ධි සංගම් නියෝජිතයන් ද මිල්ලනියේ දී රැකියා විරහිත කාන්තාවන්/පිරිමින් ද මේ සඳහා තෝරා ගෙන ඇත. මුන්දලම ප්‍රා. ලේ. කො. තුළ කල්කිරි සැපයුම සමූපකාර ප්‍රාදේශික හරහා සිදු වේ. මේ අනුව එක් එක් ප්‍රා. ලේ. කො. වල බිම් මට්ටමේ පවතින තත්ත්වයන්ට ගැළපෙන පරිදි වැඩසටහන දියත් කර ඇත. ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ චක්‍රලේඛ 2009/1 අනුව, කිරි ගොවීන් හඳුනා ගැනීම සඳහා පශු සම්පත් අංශයේ දායකත්වය ලබා ගෙන නොමැති තරම් ය.

ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය මඟින් නිකුත් කළ 2009/1 චක්‍රලේඛයට අනුව, මෙම වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ප්‍රධාන නිර්ණායක 2 කි.

01. අඩු ආදායම්ලාභී පවුල්වල වයස මාස 24 ට වැඩි හා මාස 60 ට අඩු දරුවන් වීම

02. අඩු පෝෂණ මට්ටමෙන් යුතු දරුවන් වීම

ඉහත පෝෂණ මට්ටම පිළිබඳ නිර්ණායක අනුව, ප්‍රතිලාභීන් හඳුනාගැනීමේ දී පහත සඳහන් ක්‍රම දෙක අනුගමනය කරනු ලැබේ.

- පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය විසින් සමෘද්ධිලාභී පවුල්වල ප්‍රතිලාභ ලැබිය යුතු දරුවන්ගේ මව/පියා/භාරකරු වෙත අනුමත කළ අයදුම්පත් නිකුත් කරනු ලැබීම.
- සමෘද්ධි ප්‍රතිලාභ නො ලබන නමුත්, අඩු ආදායම්ලාභී පවුල්වල අඩු පෝෂණ මට්ටම හේතුවෙන් ප්‍රතිලාභ ලැබීමට සුදුසු දරුවන් හඳුනා ගත්විට පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණිය විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ විශේෂ නිර්දේශය මත මව/පියා/ භාරකරු වෙත අයදුම්පත නිකුත් කරනු ලැබීම.

ඉහත කුමන හෝ ආකාරයකට මව/පියා/භාරකරු වෙත ලැබෙන අයදුම්පත් සම්පූර්ණ කර ආදායම් මට්ටම පිළිබඳ නිර්දේශ කිරීම සඳහා සමෘද්ධි/ග්‍රාම සංවර්ධන නිලධාරී වෙත බාරදීම, සහතික කිරීම හා ප්‍රා. ලේ. කාර්යාලයේ විෂයබාර නිලධාරී හරහා ප්‍රා. ලේ. ගේ අනුමැතියට යොමු කිරීම.

පෝෂණ මට්ටම ඉහළ නැංවීම අරමුණු කරගත් මෙම වැඩසටහන සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ මූලික නිර්ණායකය විය යුත්තේ, දරුවන්ගේ පෝෂණ මට්ටම වන බැවින්, ඉහත පිළිවෙළ අනුගමනය කිරීම නිරවද්‍ය වේ. බොහෝ ප්‍රා. ලේ. කො. ඉහත පිළිවෙළ එලෙස ම අනුගමනය කරන අයුරු නිරීක්ෂණය කළ හැක.

සමහර අවස්ථාවන් හි දී ග්‍රාම/සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින් ප්‍රතිලාභීන් වෙත නිකුත් කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර, ආදායම් මට්ටම පිළිබඳ නිර්දේශය සහිත ව පෝෂණ මට්ටම පිළිබඳ නිර්දේශය සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය වෙත ඉදිරිපත් කෙරේ.

එහෙත් ග්‍රාම/සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ප්‍රා. ලේ. කාර්යාලයේ විෂයභාර නිලධාරියාට මෙන් ම ප්‍රතිලාභීන්ට ද වඩාත් සමීප නිලධාරීන් වන බැවින් මෙම වැඩසටහන ගම වෙත සන්නිවේදනය කිරීම සඳහා ඉහත දෙවන ක්‍රමය උචිත බව පෙනේ. තව ද පවුල් සෞඛ්‍ය නිලධාරිණිය ප්‍රා. ලේ. කාර්යාලයට සම්බන්ධ නොමැති අතර ම නිලධාරී හිඟය මත එක් ගමකට එක් පවුල් සෞඛ්‍ය නිලධාරිණියක බැගින් අනුයුක්ත කර නොමැති බැවින් ග්‍රාම/සමෘද්ධි සංවර්ධන නිලධාරීන් හරහා සුදුසු ප්‍රතිලාභීන් හඳුනා ගැනීම වඩාත් කාර්යක්ෂම බව වැඩසටහනේ විෂයබාර නිලධාරීන්ගේ අදහස වේ.

ඉහත සඳහන් කළ පරිදි, ප්‍රතිලාභීන් වෙත කිරි බෙදාහැරීම කිරි ගොවියා විසින් ම හෝ බෙදාහරින්නෙකු විසින් සිදු කරනු ලැබේ. එය ප්‍රධාන ආකාර දෙකකින් සිදු කෙරේ. එනම්, කිරි ගොවියා හෝ බෙදාහරින්නන් විසින් ප්‍රතිලාභීන්ගේ නිවසට කිරි සපයනු ලැබීම හෝ ප්‍රතිලාභීන් කිරි බෙදාහරින මධ්‍යස්ථානයට පැමිණ කිරි ලබා ගැනීම යි. බෙදාහරින මධ්‍යස්ථානය කිරි නිෂ්පාදකයාගේ නිවස, සමුපකාර සමිති හෝ වෙනත් පොදු ස්ථාන වේ. එරාවූර් ප්‍රා. ලේ. කොට්ඨාසය තුළ එක් පෙර පාසලක දී කිරි බෙදා හරිනු ලැබේ. ඉහත කී පරිදි ප්‍රා. ලේ. කො. මට්ටමින් ප්‍රතිලාභීන් වෙත නැවුම් හෝ උණු කිරි බෙදා හරින ආකාරය අනුව කිරි ගොවීන් හා/ හෝ බෙදාහරින්නන්ගේ ව්‍යාප්තිය වගු අංක 2 න් ඉදිරිපත් කර ඇත.

වගු අංක 2

**ප්‍රතිලාභීන් වෙත කිරි බෙදාහරින ආකාරය අනුව කිරි ගොවීන්/බෙදාහරින්නන්ගේ ව්‍යාප්තිය**

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | කිරි බෙදා හරින ආකාරය | | එකතුව |
|---|---|---|---|
| | ප්‍රතිලාභීන් කිරි බෙදාහරින මධ්‍යස්ථානයට පැමිණ ලබා ගැනීම | ප්‍රතිලාභීන්ගේ නිවසට කිරි සැපයීම | |
| තඹුත්තේගම[1] | 2 | - | 2 |
| මිල්ලනිය | 4 | 1 | 5 |
| සූරියවැව | 2 | - | 2 |
| අඹගමුව | 23 | 13 | 36 |
| එරාවූර් | 22 | - | 22 |
| මොනරාගල | 10 | 8 | 18 |
| රිදීමාලියැද්ද | - | 10 | 10 |
| රත්නායකපුර | 4 | - | 4 |
| ඉමදුව[1] | 1 | 2 | 3 |
| එකතුව (%) | 68 (67%) | 34 (33%) | 102 |

[1] උණු කරන ලද කිරි බෙදා හරිනු ලැබේ.

මූලාශ්‍රයః ක්ෂේත්‍ර සමීක්ෂණය, (2009). හෙ.ගො.ප.පු. ආයතනය.

වගු අංක 2 පරිදි, තඹුත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වැඩසටහන දියත් කළ පහළගම ගම්මානයේ උණුකිරි බෙදා හැරීම ප්‍රායෝගික නො වන බැවින් වැඩසටහන දැනට අක්‍රිය ව පවතී. ඉමදුව ප්‍රා. ලේ. කො. තුළ තවමත් උණු කළ කිරි බෙදාහැරීම නිරීක්ෂණය කළ හැක.


## කිරි දීමනා පත්‍ර නිකුත් කිරීම, පරිහරණය හා මුදල් ප්‍රතිපූර්ණය කිරීම

කිරි දීමනා පත්‍ර නිකුත් කිරීමේ දී බොහෝ ප්‍රා. ලේ. කො. වල විෂයබාර නිලධාරීන් විසින් ඉතා ක්‍රමානුකූල ව ලිපිලේඛන නඩත්තු කරනු ලැබ ඇතත්, සමහර ප්‍රා. ලේ. කො. වල සමීක්ෂණයට අවශ්‍ය දත්ත ලබා ගැනීමට ප්‍රමාණවත් වන පරිදි වාර්තා තබනු නිරීක්ෂණය කළ නො හැකි විය. කෙසේ වෙතත් ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ 2009/1 චක්‍රලේඛයට අනුකූල ව කිරි දීමනා පත්‍ර ප්‍රතිලාභීන් අත පත් කිරීම සඳහා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත නිකුත් කළ යුතු නමුත්, වැඩසටහනට සම්බන්ධ ග්‍රාමනිලධාරීන් වෙත ද මෙම දීමනා පත්‍ර නිකුත් කර ඇති

බව නිරීක්ෂණය කරන ලදී. තව ද දීමනා පත්‍ර ප්‍රතිලාභීන් සන්තකයේ තබා ගත යුතු වුව ද කිරි දීමනා පත්‍ර නැතිවීම, හානිවීම, එකවර නැවත එකතු කරගැනීම අපහසු වීම යනාදී විවිධ ප්‍රායෝගික අපහසුතා මත මුදල් ප්‍රතිපූරණය කිරීම ප්‍රමාදවීම වළක්වා ගැනීමේ අරමුණින් මෙම දීමනා පත්‍ර ප්‍රතිලාභීන් අතට පත් නො කර කිරි ගොවියා, කිරි බෙදාහරින්නා නිලධාරීන් හෝ වෙනත් ප්‍රතිලාභීන් අතට පත් කර ඇති අවස්ථා ද නිරීක්ෂණය කරන ලදී. කිරි දීමනා පත්‍ර ළඟ තබා ගන්නා එක් එක් පාර්ශ්වකරුවන්ගේ ව්‍යාප්තිය ප්‍රස්ථාර අංක 3 න් ඉදිරිපත් කර ඇත.

ප්‍රස්ථාර අංක 3

**කිරි දීමනා පත්‍ර පරිහරණය කරන පුද්ගලයන්ගේ ව්‍යාප්තිය**




N=815

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, (2009). හෙ.ගො.ප.පු. ආයතනය.

කිරි නිෂ්පාදකයා හෝ බෙදාහරින්නා මාසික ව ප්‍රතිලාභීන් වෙත කිරි සැපයීමෙන් අනතුරු ව ග්‍රාම/ සමෘද්ධි සංවර්ධන නිලධාරියාගේ සහතික කිරීම සහිත ව දීමනා පත්‍ර ප්‍රා. ලේ. කාර්යාලයේ විෂයබාර නිලධාරියා වෙත බාර දේ. එම නිලධාරියා අදාළ වටිනාකම මුදලින් හෝ චෙක්පතකින් ගෙවීමට කටයුතු යොදයි.

## 6. කිරි වීදුරුව වැඩසටහනේ ප්‍රතිඵල

### 6.1 අධ්‍යයන ප්‍රදේශවල ග්‍රාම නිලධාරී වසමේ මට්ටමෙන් වැඩසටහනේ ව්‍යාප්තිය


වයස මාස 24 ට වැඩි හා මාස 60 ට අඩු පෝෂණ ඌනතාවයෙන් පෙළෙන අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් වෙත මසකට අවම දින 25 ක් කිරි වීදුරුවක් ලබා දීම "කිරි වීදුරුව" වැඩසටහනෙන් අපේක්ෂා කෙරේ.

අධ්‍යයනය සඳහා තෝරාගත් ප්‍රා. ලේ. කොට්ඨාස දහය තුළ ග්‍රාමනිලධාරී වසම් මට්ටමෙන් වැඩසටහනේ ක්‍රියාත්මකභාවය ප්‍රස්ථාර අංක 4 න් පෙන්නුම් කර ඇත. ඒ අනුව. ප්‍රා. ලේ.

කොට්ඨාස දහයට අයත් ග්‍රා. නි. වසම් 369 කින් දැනට වැඩසටහන ක්‍රියාත්මක වන්නේ, ග්‍රා. නි. වසම් 177 (48%) ක පමණි. වසම් 109 (30%) ක වැඩසටහන ආරම්භ කර නොමැති අතර, තවත් වසම් 83 (22%) ක වැඩසටහන ආරම්භ කළ ද විවිධ දුෂ්කරතා හමුවේ එය ක්‍රියාවිරහිත වී ඇත.

ප්‍රස්ථාර අංක 4

### ග්‍රාමනිලධාරී කොට්ඨාස මට්ටමින් වැඩසටහනේ ක්‍රියාකාරීත්වය




N= 369

මූලාශ්‍රයː ක්ෂේත්‍ර සමීක්ෂණය, (2009). හෙ.ගො.ප.පු. ආයතනය.

ඉහත සඳහන් කළ පරිදි අදාළ ග්‍රාම නිලධාරී වසම් තුළ එම වැඩසටහන ආරම්භ නො කිරීම සඳහා පහත සඳහන් හේතු බලපා ඇත.

- වැඩසටහනට සම්පතම නිලධාරියෙකුට වගකීම නො පවරා නිලධාරීන් කීපදෙනකුට වගකීම පැවරීම.
- ඇරඹුමේ දී වැඩසටහන හඳුන්වා දුන් ආකාරයට කිරි උණුකර දරුවන් වෙත ලබාදීමට ගොවීන් අකමැති වීම හා පෙර පාසල් ආරම්භ කරන වේලාවට පෙර කිරි උණුකර ලබාදීම අපහසු වීම.
- පවතින මිල ගණන්වලට කිරි සැපයීමට ගොවීන් අකමැති වීම, කිරි දෙනුන් ඇතත්, කිරි නො දෙවීම හා ඉහළ ප්‍රමිතියකින් හා සෞඛ්‍යාරක්ෂිත කිරි සපයා ගත නො හැකි වීම.
- වසම තුළින් කිරි ගොවීන්/කිරි සපයා ගත නො හැකි වීම.
- නිලධාරීන්ගේ උනන්දුව හීනවීම.
- කිරි බෙදාහරින්නා විසින් තමන්ට කිරි බෙදාහැරීමට පහසු වසම් පමණක් තෝරා ගනු ලැබීම.

## 6.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ ප්‍රතිලාභීන්ගේ ව්‍යාප්තිය

අධ්‍යයනයට ලක් කළ ප්‍රා. ලේ. කො. දහය තුළ මෙම වැඩසටහන දැනට ක්‍රියාත්මක වන ග්‍රා. නි. වසම් 177 ක ප්‍රතිලාභ ලබන දරුවන් සංඛ්‍යාව 4,520 කි. එක් එක් ප්‍රා. ලේ. කොට්ඨාසයේ සුදුසුකම් ලත් මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව හා දැනට ප්‍රතිලාභ ලබන සංඛ්‍යාව පිළිබඳ රැස් කළ දත්ත වගු අංක 3 න් ඉදිරිපත් කර ඇත. එම දත්ත අනුව මිල්ලනිය, සූරියවැව, තඹුත්තේගම හා මොනරාගල ප්‍රා. ලේ. කොට්ඨාසවල වැඩසටහන ක්‍රියාත්මක වන ග්‍රා. නි. වසම් ප්‍රතිශතයට සාපේක්ෂ ව එක් එක් ප්‍රා. ලේ. කොට්ඨාසයේ ප්‍රතිලාභීන් ප්‍රතිශතය ද දළ වශයෙන් සමානුපාතික බව නිරීක්ෂණය කළ හැකි නමුත් අනෙකුත් ප්‍රා. ලේ. කොට්ඨාසවල එවැන්නක් නිරීක්ෂණය කළ නො හැක. එබැවින් සමහර ප්‍රා. ලේ. කො. සම්බන්ධයෙන් එම දත්තවල නිරවද්‍යතාවය අවිනිශ්චිත ය. උදාහරණ ලෙස, සූරියවැව ප්‍රතිලාභ ලබා ඇති ප්‍රතිශතය 98% ක් වුව ද ක්‍රියාත්මක ග්‍රා. නි. වසම් සංඛ්‍යාව 5 (23%) ක් පමණි. ඉතිරි වසම් 17 තුළ වැඩසටහන අක්‍රීය වී ඇත. මේ අනුව, අධ්‍යයන ප්‍රදේශවල "කිරි විදුරුව" වැඩසටහන මගින් ආවරණය කර ඇති ප්‍රතිලාභීන් ප්‍රතිශතයේ මධ්‍යන්‍යය 45% ක් ලෙස වගු අංක 3 න් පෙන්නුම් කළ ද, එය නිවැරදි තක්සේරුවක් නො විය හැක. නිවැරදි දත්ත රැස් කිරීමේ අපහසුතා මත වැඩසටහනේ ප්‍රතිඵල පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම අපහසු විය.

**වගු අංක 3**

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ප්‍රතිලාභීන්ගේ ව්‍යාප්තිය**

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | සුදුසුකම් ලත් මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වත්මන් ප්‍රතිලාභීන් | |
|---|---|---|---|
| | | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| මිල්ලනිය | 1383[1] | 220 | 16 |
| අඹගමුව | 3024[1] | 2000 | 66 |
| සූරියවැව | 594[1] | 145 | 24 |
| තඹුත්තේගම | 533[1] | 16 | 3 |
| රස්නායකපුර | - | 233 | - |
| එරාවූර් | 936[1] | 750 | 80 |
| මොනරාගල | 934[2] | 220 | 24 |
| රිදීමාලියැද්ද | 730[1] | 713 | 98 |
| ඉමදූව | 585[1] | 69 | 12 |
| මුත්දලම | 957[1] | 154 | 16 |
| එකතුව | 9445[3] | 4520 | 45[3] |


මූලාශ්‍ර: [1]ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය, (2009). [2]අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල, (2009). [3]රස්නායකපුර හැර.

## 6.3 ප්‍රතිලාභ ලබන දරුවන්ගේ වයස් කාණ්ඩ

මෙම සමීක්ෂණය සඳහා සහභාගී වූ ප්‍රතිලාභීන්ගේ මව/පියා/භාරකරුවන් සංඛ්‍යාව 816 කි. ඔවුන් විසින් සපයන ලද තොරතුරුවලට අනුව මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 836 ක් වන අතර, ඉන් 433 ක් (52%) ගැහැනු දරුවන් සහ 403 ක් (48%) පිරිමි දරුවන් ය. වයස් කාණ්ඩ අනුව එම ප්‍රතිලාභීන්ගේ ව්‍යාප්තිය ප්‍රස්ථාර අංක 5 න් ඉදිරිපත් කර ඇත.

ප්‍රස්ථාර අංක 5

**වයස් කාණ්ඩ අනුව ප්‍රතිලාභීන්ගේ ව්‍යාප්තිය (%)**




N=836

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, (2009). හෙ.ගො.ප.පු. ආයතනය.


ප්‍රස්ථාර අංක 5 න් පැහැදිලි වන පරිදි, ප්‍රතිලාභීන් බහුතරයක් (79%) වයස මාස 36 ත් මාස 60 ත් අතර, දරුවන් ය. වයස මාස 24 සිට මාස 36 දක්වා ප්‍රතිලාභ ලබන දරුවන් සංඛ්‍යාව 13% ක් වේ. ඒ හැරුණු කොට අදාළ වයස් කාණ්ඩවලින් පරිබාහිර ව එනම්, වයස මාස 24 ට අඩු දරුවන් (1%) හා වයස මාස 60 ට වැඩි දරුවන් (7%) ප්‍රතිලාභීන් අතර ඇත. ප්‍රතිලාභීන් සංඛ්‍යාව ප්‍රමාණවත් නො වන අවස්ථාවන් හි දී වයස මාස 24 ට ආසන්න දරුවන් කීපදෙනෙකු ද (1%) වැඩසටහනට සම්බන්ධ කරගැනීමත්, අයදුම්පත් ඉදිරිපත් කරන අවධියේ වයස මාස 60 සම්පූර්ණ නොවූ නමුත් ප්‍රතිලාභ ලබන විට මාස 60 ඉක්මවා තිබීමත් හේතුවෙන් මෙසේ අදාළ නො වන වයස් කාණ්ඩවල දරුවන් ද ප්‍රතිලාභ ලබා ඇත.

## 6.4 ප්‍රතිලාභීන් වෙත කිරි සපයන ආකාරය

ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයේ 2009/1 චක්‍රලේඛයට අනුව, ප්‍රතිලාභීන්ගේ නිවසට හෝ වඩාත් පහසු ස්ථානයකට කිරි සපයා දිය යුතු බවට උපදෙස් දී ඇත. එහෙත් එම පහසුකම භුක්ති විඳින්නේ ප්‍රතිලාභීන්ගෙන් 20% ක් පමණි (ප්‍රස්ථාර අංක 6). තඹුත්තේගම දී කිරි බෙදාහරින මධ්‍යස්ථානයට පැමිණ උණු කළ කිරි දරුවන්ට පොවා ගතයුතු බවට පශු වෛද්‍ය කාර්යාලය මඟින් උපදෙස් ලබා දී ඇතත්, එම ක්‍රමවේදයේ දුෂ්කරතා හමුවේ වැඩසටහන අක්‍රිය වී ඇත. ප්‍රතිලාභීන්ගෙන් බහුතරයක් (60%) ගොවියාගේ නිවසින් හෝ බෙදාහරින මධ්‍යස්ථානයෙන් රැගෙන යන කිරි නිවසේ දී උණුකර දරුවන්ට පානය කිරීමට ලබා දෙති. මුත්දලමේ දී සමූපකාර ප්‍රාදේශීය මඟින් එකවර කල්කිරි ලබා දේ. උණු කළ කිරි සැපයීම ඉමදූවෙන් වාර්තා වන අතර, උණු කිරි ප්‍රතිලාභීන්ගේ නිවසට බෙදාහැරීම හෝ ප්‍රතිලාභීන් ගොවියාගේ/බෙදාහරින්නන්ගේ නිවසට පැමිණ රැගෙන යෑම සිදු කෙරේ.

**ප්‍රස්ථාර අංක 6**

**ප්‍රතිලාභීන් වෙත කිරි සපයන ආකාරය**




N= 712


මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, (2009). හෙ.ගො.ප.පු. ආයතනය.

## 6.5 ප්‍රතිලාභීන් වෙත කිරි බෙදාහරින හා පානය කරන වේලාවන්

ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය මගින් නිකුත් කළ 2009/1 චක්‍රලේඛය මගින් කිරි බෙදාහැරිය යුතු වේලාව පිළිබඳ උපදෙස් නිකුත් කර නැති නමුත් ඊට පෙර ලබාදී ඇති උපදෙස් අනුව කිරි බෙදාහැරීම පෙරවරු 7.30 ට පෙර අවසන් කළ යුතු ය. එහෙත් ප්‍රස්ථාර අංක 7 න් දැක්වෙන පරිදි අවම වශයෙන් උදෑසන අටට පෙර කිරි පානය කරන්නේ, ප්‍රතිලාභීන්ගෙන් 14% ක් පමණි.

**ප්‍රස්ථාර අංක 7**

**ප්‍රතිලාභීන් කිරි ලබා ගන්නා හා පානය කරන වේලාවන්**




N= 708

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, (2009). හෙ.ගො.ප.පු. ආයතනය.

ප්‍රස්ථාර අංක 7 අනුව, උදෑසන 10 ට පෙර කිරි ලබා ගන්නා ප්‍රතිලාභීන්ගේ මුළු ප්‍රතිශතය 81% කි. එහෙත් උදෑසන 10 ට පෙර කිරි පානය කරන්නේ ප්‍රතිලාභීන්ගෙන් 57% කි. වැඩි ම ප්‍රතිලාභීන් පිරිසක් කිරි පානය කරන්නේ උදෑසන 8-10 ත් අතර ය. ප්‍රතිලාභීන්ගෙන් 1/3 ක් උදෑසන 10 ත් 12 ත් අතර කිරි පානය කරති. මධ්‍යාහ්න 12 න් පසු කිරි පානය කරන අවස්ථා ද හමුවූ අතර, පෙර පාසල් දරුවන් හා ප්‍රමාද වී කිරි බෙදා හරින්නන්ගේ ප්‍රතිලාභීන් මීට අයත් වේ. විශේෂයෙන් ඒරාවූර් ප්‍රදේශයේ දී සවස 3.00 ට පමණ කිරි පානය කිරීම මෙන් ම කිරිවල සෞඛ්‍යාරක්ෂිත තත්ත්වය පිළිබඳ ගැටලු මතු වූ අවස්ථා ද වාර්තා විය. ප්‍රස්ථාර අංක 7 න් ඉදිරිපත් කර ඇති දත්ත ස්ථානීය වශයෙන් විචලනය වන ආකාරය පහත පරිදි ඉතා ලුහුඬින් ඉදිරිපත් කළ හැක.

වගු අංක 4

| වේලාව උදෑසන | කිරි ලබා ගන්නා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | කිරි පරිභෝජනය කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය |
|---|---|---|
| 7 ට පෙර | අඹගමුව, රිදීමාලියැද්ද, රත්නායකපුර | අඹගමුව, රිදීමාලියැද්ද |
| 7 සිට 8 ට පෙර | අඹගමුව, රිදීමාලියැද්ද, ඉමදූව, මොනරාගල | රත්නායකපුර, මිල්ලනිය |
| 8 සිට 10 ට පෙර | සියලු ම ප්‍රා.ලේ.කොට්ඨාස | සියලු ම ප්‍රා.ලේ.කොට්ඨාස |
| 10 සිට 12 ට පෙර | සියලු ම ප්‍රා.ලේ.කොට්ඨාස | ප්‍රා.ලේ.කොට්ඨාස |
| මධ්‍යාහ්න 12 න් පසු | රත්නායකපුර, ඒරාවූර් | රත්නායකපුර, ඒරාවූර් |


මේ අනුව, පෙනී යන්නේ කිරි බෙදාහරින්නන් තම වගකීම ඉටු කිරීමට දරා ඇති ප්‍රයත්නයට සාපේක්ෂ ව ප්‍රතිලාභීන් මෙම වැඩසටහනෙන් ප්‍රයෝජන ගැනීමට සමත් වී නොමැති බව යි.

## 6.6 ප්‍රතිලාභීන් වෙත බෙදා හරින කිරි ප්‍රමාණය

දරුවන්ට දිනපතා ලබා දිය යුතු කිරි මාත්‍රාව මි.ලී. 200 කි. එහෙත් සමීක්ෂණයෙන් හෙළිදරව් වන පරිදි බහුතරයක් (45% ක්) ප්‍රතිලාභීන් වෙත ලැබෙන්නේ කිරි මි.ලී. 200 කට අඩු ප්‍රමාණයකි (ප්‍රස්ථාර අංක 8). කිරි රැගෙන යාම සඳහා බොහෝ අවස්ථාවල දී 1/4 බෝතල් භාවිතා කරනු ලැබේ. එම 1/4 බෝතලයක පරිමාව මි.ලී. 200 ට අඩු ය. නමුත් ප්‍රතිලාභීන්ට එම වෙනස පිළිබඳ අවබෝධයක් නැත. මේ හේතුවෙන් ප්‍රතිලාභීන් බහුතරයකට නියමිත කිරි මාත්‍රාව නො ලැබී ගොස් ඇත. තව ද සමහර කිරි නිෂ්පාදකයන්, ප්‍රතිලාභීන් සංඛ්‍යාවට ප්‍රමාණවත් කිරි නොමැති දිනවල දී මෙසේ අඩු කිරි ප්‍රමාණයක් ලබා දේ. ඒ අනුව නියමිත කිරි මාත්‍රාව ලැබෙන බවට වාර්තා කර ඇත්තේ ප්‍රතිලාභීන්ගෙන් 16% ක් පමණි. කිරි බෙදාහැරීම පිළිබඳ තවත් පැතිකඩක් ප්‍රස්ථාර අංක 8 න් අන්තර්ගත වේ. එනම්, දිනපතා කිරි බෙදාහැරීම සිදු නො වන ප්‍රදේශවල දී (උදා: සූරියවැව) සතියක හෝ දින කීපයක කිරි එකවර ලබාදීමත්, මුන්දලමේ දී කල්කිරි බෝතල් එකවර ලබාදීමත් හේතුවෙන් දිනකට ලබාදෙන කිරි ප්‍රමාණය මි. ලී. 200 ඉක්මවා ඇත.

**ප්‍රස්ථාර අංක 8**

**ප්‍රතිලාභීන් වෙත බෙදාහරින කිරි ප්‍රමාණය**




N= 805


මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, (2009). හෙ.ගො.ප.පු. ආයතනය.

## 6.7 කිරි සපයන දින ගණන

ප්‍රතිලාභීන්ගේ මව්/පියා/භාරකරුවන් ලබා දුන් දත්තවලට අනුව, මසකට කිරි ලබා දෙන දින ගණන ප්‍රස්ථාර අංක 9 න් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, අවම වශයෙන් දින 25 ක් වත් කිරි ලැබෙන ප්‍රතිලාභීන් ප්‍රතිශතය 30% කි. දින 5 කට අඩු සංඛ්‍යාවක් කිරි බෙදාහැරීම මුත්දලමේ කල්කිරි බෙදාහැරීම සම්බන්ධයෙන් වාර්තා වේ. ඉතා සුළු ප්‍රතිශතයක් ගොවීන් වැඩසටහන පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයකින් තොරව දින 25 කට වඩා කිරි බෙදාහරින බව වාර්තා විය. නමුත් මෙම ප්‍රතිචාරවලින් බහුතරයක් කිරි බෙදාහැරීම පිළිබඳ කිසිදු වාර්තා තැබීමකින් තොරව ලබා දුන් ඒවා බව අවධාරණය කළ යුතු අතර, ප්‍රතිලාභීන් අතරින් වාර්තා තැබීම සිදු කරන්නේ 24% ක් පමණි. දින 25 ට වඩා අඩුවෙන් කිරි බෙදා හැරීමට ප්‍රධාන හේතු 2 කි. දිනපතා සැපයීමට ප්‍රමාණවත් කිරි සපයා ගත නො හැකි වීම හා දින කීපයක කිරි එකවර සැපයීම ඊට හේතු වේ.

**ප්‍රස්ථාර අංක 9**

**ප්‍රතිලාභීන් වෙත කිරි සපයන දින ගණන**




N= 760

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, (2009). හෙ.ගො.ප.පු. ආයතනය.


## 6.8 කිරි වීදුරුවට ගොවීන්ගෙන් ලබා ගන්නා කිරි ප්‍රමාණය

ග්‍රාමීය කිරි ගොවීන් නඟාසිටුවීම "කිරි වීදුරුව" වැඩසටහනේ තවත් අරමුණකි. ග්‍රාමීය කිරි ගොවීන් වැඩසටහනට සපයන කිරි ප්‍රමාණය අනුව ඔවුන්ගේ ව්‍යාප්තිය ප්‍රස්ථාර අංක 10 න් ඉදිරිපත් කර ඇත.

"කිරි වීදුරුව" වැඩසටහනට ලබා දෙන කිරි ප්‍රමාණය පිළිබඳ තිරවුල් ව දත්ත ලබා දුන් කිරි ගොවීන් සංඛ්‍යාව 62 කි. ඉන් පහෙන් එකක් පමණ ම (21%) දිනකට කිරි ලීටර් දෙකකටත් වඩා අඩු ප්‍රමාණයක් සපයමින් වැඩසටහනට දායක වේ. බහුතරයක් වූ 40% ක් කිරි ලීටර් දෙකේ සිට පහකට අඩු ප්‍රමාණයක් සපයයි. ඉතිරි 39% දිනකට කිරි ලීටර් පහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සපයමින් සැලකිය යුතු මට්ටමේ ස්ථාවර ආදායමක් ද ඉපයීමට සමත් ව සිටිති.

ප්‍රස්ථාර අංක 10

### "කිරි වීදුරුව" වැඩසටහනට සපයනු ලබන කිරි ප්‍රමාණය අනුව කිරි ගොවීන්ගේ ව්‍යාප්තිය




N= 62

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, (2009). හෙ.ගො.ප.පු. ආයතනය.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කිරි වීදුරුව වැඩසටහනේ ප්‍රතිඵල වගු අංක 5 න් ඉදිරිපත් කර ඇත.

වගු අංක 5

### ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කිරි වීදුරුවේ ප්‍රතිඵල

| විස්තරය | තඹුත්තේගම | මිල්ලනිය | පුජියවැව | අඹගමුව | ඉමදුව | ඒරාවූර් | මොනරාගල | රිදීමාලියැද්ද | මූත්දලම | රස්නායකපුර | අවම | උපරිම | සමස්ත |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රතිලාභීන් සංඛ්‍යාව(වත්මන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව සුදුසුකම් ලත් මුළු ප්‍රතිලාභී සංඛ්‍යාවෙන් % ක් ලෙස (N=9445) | 3 | 16 | 24 | 66 | 12 | 80 | 24 | 98 | 16 | - | 3 | 80 | 45.0 |
| ක්‍රියාත්මක ග්‍රාම නිලධාරී වසම් ගණන (ප්‍රා. ලේ. කො. තුළ මුළු ග්‍රා.නි.ව. සංඛ්‍යාවෙන් % ක් ලෙස) (N=369) | 4 | 16 | 23 | 96 | 19 | 97 | 23 | 55 | 42 | 43 | 4 | 97 | 48.0 |
| සියලු ප්‍රතිලාභීන් අතර අදාළ වයස් කාණ්ඩයේ දරුවන් % (N=836) | 100 | 82 | 98 | 97 | 95 | 89 | 97 | 96 | 75 | 98 | 75 | 100 | 92.0 |
| ප්‍රතිලාභීන් නිවසට හෝ ආසන්නයට කිරි ලබාදීම % (N=712) | - | 9 | - | 25 | 50 | - | 44 | 44 | - | 6 | 6 | 50 | 19.5 |
| උදෑසන 8 ට පෙර කිරි ලබාදීම % (N=712) | - | 71 | - | 51 | 48 | - | 49 | 8 | - | 54 | 8 | 71 | 33.0 |
| උදෑසන 8 ට පෙර කිරි පානය කිරීම %(N=708) | - | 15 | - | 25 | 33 | - | 25 | 6 | - | 22 | 6 | 33 | 14.0 |
| අවම දින 25 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් කිරි ලැබීම % (N=760) | - | 95 | - | - | 74 | - | - | 1 | - | 99 | 1 | 99 | 30.0 |
| දිනකට නියමිත කිරි මාත්‍රාව ලැබීම (N=805) | 100 | 11 | - | 7 | 4 | - | 3 | - | - | 1 | 1 | 100 | 16.0 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, (2009). හෙ.ගො.ප.පු. ආයතනය.

## 7. වැඩසටහනේ ගැටලු

"කිරි විදුරුව" වැඩසටහනේ සාර්ථකත්වය කෙරෙහි ප්‍රතිලාභීන්, නිලධාරීන්, කිරි ගොවීන් හා කිරි බෙදාහරින්නන් ලබා දෙන සක්‍රීය දායකත්වය එක සේ වැදගත් වේ.

ඉහත පාර්ශ්වකරුවන් වැඩසටහන පිළිබඳ ව වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ ගැටලු තුළින් වැඩසටහනේ ප්‍රමුඛ හා පොදු ගැටලු/දුෂ්කරතා කවරේ ද? යන්නත්, යෝජිත විකල්ප විසඳුම් හරහා වැඩසටහනේ සමස්ත ප්‍රගතිය අත්පත් කරගත හැක්කේ කෙසේ ද යන්නත් පිළිබඳවත් අවබෝධ කරගැනීම වැදගත් වේ. ඊට ආධාරකයක් ලෙස ප්‍රතිලාභීන් හා අනෙකුත් පාර්ශ්වකරුවන් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ ගැටලු හා යෝජනා පිළිබඳ ප්‍රතිචාරයන්ගේ සාරාංශයක් වගු අංක 6 න් ඉදිරිපත් කර ඇත. ඉන් පැහැදිලි වන පරිදි "කිරි බෙදාහැරීමේ දුෂ්කරතාව" මෙම වැඩසටහනේ ප්‍රමුඛතම ගැටලුව බව පැහැදිලි ය. ඒ කිරි ගොවීන් හා බෙදාහරින්නන් අත්විඳින ලද හා වැඩසටහන දියත් කිරීමේ දී නිලධාරීන් නිරීක්ෂණය කරන ලද ප්‍රධානතම ගැටලුවක් මෙන් ම කලට වේලාවට, අපහසුවකින් තොරව, නියමිත කිරි මාත්‍රාව සෞඛ්‍යාරක්ෂිත ව ලබා ගැනීම සම්බන්ධයෙන් ප්‍රතිලාභීන්ට ද වලංගු ගැටලුව වන බැවිනි.

කිරි බෙදාහරින්නන් හැරුණු කොට අනෙකුත් පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරන ලද දෙවන ප්‍රමුඛතාවයෙන් යුතු ගැටලුව වන්නේ, "පරිපාලනමය තීරණ ආශ්‍රිත විවිධ ගැටලු" ය. කිරි දීමනා පත්‍ර සඳහා මුදල් ගෙවීම ප්‍රමාදවීම හා පරිපාලනමය මැදිහත්වීම් තුළින් විසඳිය යුතු වෙනත් කරුණු වන ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායක හා අයදුම්පත් නිර්දේශ කිරීමේ ප්‍රමාදයන් පිළිබඳ ගැටලු, නිලධාරීන්ගේ අකාර්යක්ෂමභාවය හා කිරි වෙනුවට විකල්පයක් ලබානොදීම යනාදිය මේ යටතට ගැනේ.

කිරි ගොවීන් හැරුණු කොට අනෙකුත් පාර්ශ්වයන් විසින් ඉස්මතු කරන ලද අනෙක් ප්‍රධාන ගැටලුව වන්නේ, "කිරි විදුරුව" වැඩසටහන පිළිබඳ අධීක්ෂණයක් නොමැති වීම යි. නිලධාරීන්ගේ මට්ටමින් ඔවුන් ඉටු කරන සේවාව අගය නො කිරීමත්, විශාල ප්‍රදේශයක් පුරා ව්‍යාප්ත ව පවතින වැඩසටහන අධීක්ෂණය කළ නො හැකි වීමත් වැඩසටහනේ දුර්වලතාවයන් ලෙස සඳහන් කෙරේ.

වගු අංක 6

**කිරි වීදුරුව වැඩසටහනේ පාර්ශ්වකරුවන් විසින් ඉදිරිපත් කරන ලද ගැටලුවල සාරාංශය**

| ගැටලු | කිරි ගොවීන් | බෙදා හරින්නන් | නිලධාරීන් | ප්‍රතිලාභීන් | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| කිරි බෙදා හැරීමේ දුෂ්කරතා | 19 | 50 | 88 | 187 | 344 | *54.0* |
| පරිපාලනමය තීරණ ආශ්‍රිත ගැටලු | 31 | - | 26 | 59 | 116 | 18.2 |
| අධීක්ෂණයක් සිදු නො වීම | - | 5 | 7 | 90 | 102 | 16.0 |
| කිරි සපයා ගැනීම ආශ්‍රිත ගැටලු | 33 | - | 15 | - | 48 | 6.8 |
| පාර්ශ්වකරුවන් අතර අනවබෝධය හා උනන්දුව අඩුකම | - | - | 30 | - | 30 | 5.0 |
| එකතුව | 83 | 55 | 166 | 336 | 640 | 100.0 |

මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර සමීක්ෂණය, (2009). හෙ.ගො.ප.පු. ආයතනය.

සමහර කිරි බෙදාහරින්නෝ තමන් වෙත ලැබෙන කිරිවල ප්‍රමිතිය පිළිබඳ සෑහීමකට පත් නො වෙති. අධීක්ෂණය නො කිරීමත් ප්‍රමිතිය මැනීමේ ක්‍රමවේදයක් නොමැති වීමත් ඊට අදාළ දුර්වලතාවයන් ලෙස සඳහන් කරන ලදී. අධීක්ෂණයක් සිදු නො වීම නිසා පැනනැඟී ඇති දුර්වලතාවයන් වන්නේ ප්‍රතිලාභීන් වෙත නියමිත දින ගණන කිරි නො ලැබීම, කිරිවල අඩු ප්‍රමිතිය, සෞඛ්‍යාරක්ෂිත බවින් තොර වීම යනාදිය යි.

වැඩසටහන දැනට ක්‍රියාත්මක වන වසම්වල මීළඟ ප්‍රධාන ගැටලුව වශයෙන් සඳහන් වී ඇත්තේ, "කිරි සපයා ගැනීම ආශ්‍රිත ගැටලු" වේ. අනෙකුත් කිරි එකතු කරන සමාගම් විසින් කිරි ගොවීන් වෙත ලබා දෙන අමතර දිරිගැන්වීම් "කිරි වීදුරුව" වැඩසටහනෙන් නො ලැබීම නිසා කිරි සැපයීම කෙරෙහි ඔවුහු උනන්දු නො වෙති. කිරි මිල ඔවුනට දෙවනුව වැදගත් වන කාරණයකි. කෙසේ වෙතත් කිරි උණුකර සැපයීම සඳහා දැනට ගෙවන මිල ප්‍රමාණවත් නො වන බව ඔවුන්ගේ අදහස වේ. තම තමන්ගේ වසම්වල වැඩසටහන දියත් කිරීමේ දී වසම තුළ කිරි ගොවීන් නොමැති වීම, සත්ව පාලනයේ යෙදුණ ද ප්‍රමාණවත් තරම් කිරි දොවා ගත නො හැකි වීම යන කරුණු කිරි සපයා ගැනීම කෙරෙහි යම්තාක් දුරට හෝ බලපා ඇති බව නිලධාරීන්ගේ ප්‍රතිචාරවලින් පැහැදිලි වේ.

වැඩසටහනේ විවිධ පාර්ශ්වකරුවන් අතර අනවබෝධය හා උනන්දුව අඩුකම තවත් ගැටළුවකි. විශේෂයෙන් කිරි පානය ආශ්‍රිත සෞඛ්‍ය ගැටලු එනම්, සෙම රෝග තත්ත්වයන් ඇතිවීම පිළිබඳ ව ප්‍රතිලාභීන් දරන පසුගාමී ආකල්ප හා මෙම වැඩසටහනේ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අඩු උනන්දුවක් දැක්වීම ඊට අනුග්‍රහය දක්වන කිරි ගොවීන්, සැපයුම්කරුවන් හා නිලධාරීන් අධෛර්යමත් කිරීමට හේතු වී ඇත. විශේෂයෙන් කිරි පාරිභෝජනය සෙම රෝග වර්ධනය සඳහා හේතු වන බව ජනතාව විශ්වාස කරති. කිරි පාරිභෝජනය වර්ධනය කිරීම අරමුණු කරගත් කිරි ගම්මාන ඇගයීමේ වැඩසටහන යටතේ ලබාගත් අත්දැකීම් තුළින් ද මේ තත්ත්වය තහවුරු වී ඇත (හිටිහාමු සහ ඇපාසිංහ, 2009). නිලධාරීන් ද වැඩසටහන සාර්ථක ව දියත් කිරීමට ප්‍රමාණවත් තරමින් දැනුවත් වී නැති බවට අදහස් ඉදිරිපත් විය. ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීම හා චක්‍රලේඛ නිකුත් කිරීම හැරුණු කොට මෙම වැඩසටහනේ ජාතික අරමුණු පිළිබඳ ව ඔවුන් ප්‍රමාණවත් පරිදි දැනුවත් වී නැත. නව ද ක්‍රියාත්මක වැඩපිළිවෙළේ විවිධ විචලතා ඔවුන් අපේක්ෂා කළ ද, ඒ පිළිබඳ සංවාදයකට එළඹී අනුමැතිය ලබාගැනීමට ඔවුනට මෙතෙක් අවස්ථාවක් එළඹී නැති අතර, ඔවුන් ව අගය කිරීමක් ද සිදු කර නැත. එබැවින් නිලධාරීන් ඉදිරිපත් කළ

විකල්ප යෝජනාවන් කෙරෙහි අවධානය යොමු කර වැඩසටහන සාර්ථක ව දියත් කිරීමට අනදීම අවශ්‍ය වේ.

## 8. කිරි විදුරුව සාර්ථක කරගැනීම සඳහා විකල්ප හා විසඳුම්

වගු අංක 7

**"කිරි විදුරුව" වැඩසටහනේ පාර්ශ්වකරුවන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවල සාරාංශය**

| ගැටළු | කිරි ගොවීන් | බෙදා හරින්නන් | නිලධාරීන් | ප්‍රතිලාභීන් | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| පරිපාලනමය මැදිහත්වීම් | 23 | 6 | 47 | 306 | 382 | *36.0* |
| කිරි ගොවීන් දිරිමත් කිරීම | 73 | 29 | 23 | 162 | 287 | 27.6 |
| බෙදාහැරීමේ දුෂ්කරතා මඟහැරීම | 7 | 7 | 57 | 187 | 258 | 24.0 |
| දැනුවත් කිරීම | - | 6 | 57 | 10 | 73 | 7.0 |
| අධීක්ෂණය | - | 3 | 15 | 38 | 56 | 5.4 |
| එකතුව | 103 | 51 | 199 | 703 | 1056 | 100 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය, (2009). හෙ.ගො.ප.පු. ආයතනය.

වගු අංක 7 ට අනුව සියලු ම පාර්ශ්වයන් විසින් යෝජනා කරනු ලැබූ පරිදි දීමනා ගෙවීමේ ප්‍රමාදයන් වැළැක්වීම හා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාවලියේ දී ප්‍රතිලාභීන් මෙන් ම නිලධාරීන් ද මුහුණ පාන දුෂ්කරතා අවම කිරීමට පරිපාලනමය වශයෙන් මැදිහත්වීම ඔවුන්ගේ ප්‍රධාන යෝජනාව වේ.

මෙම වැඩසටහනේ ප්‍රධාන අනුග්‍රාහකයන් කිරි ගොවීන් ය. ඔවුන් වැඩසටහන සමඟ අඛණ්ඩ ව රැඳී සිටීම එහි තිරසාරභාවය කෙරෙහි වැදගත් වේ. නමුත් අපේක්ෂිත පරිදි වැඩසටහනට සම්බන්ධ ගොවීන් නඟාසිටුවීම සඳහා වැඩපිළිවෙළක් මෙතෙක් ක්‍රියාවට නංවා නැත. කිරි සඳහා සාපේක්ෂ ව ඉහළ මිලක් ලබා දුන්න ද අමතර දිරිගැන්වීම් නොමැති වීම හමුවේ ගොවීන් මෙම වැඩසටහන හා සම්බන්ධ වී සිටීමට අධෛර්යමත් වී ඇත. කිරි ගොවීන් දිරිමත් කිරීම සියලු ම පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරන ලද ප්‍රධාන යෝජනාවකි.

බෙදාහැරීමේ දුෂ්කරතා මඟහැරවීම ඊළඟ වැදගත් කාරණය වේ. දැනට වැඩසටහනට සම්බන්ධ පාර්ශ්වයන් අතින් කිරි බෙදාහැරීමේ වත්මන් දුෂ්කරතා ඉදිරිපත් කිරීම හැරුණු කොට එවා වළක්වා ගත යුත්තේ කෙසේ ද? යන්න පිළිබඳ විශේෂ උපක්‍රම හෝ අදහස් ඉදිරිපත් වූයේ නැත.

ප්‍රතිලාභීන් අතර පවතින දුර්මත බැහැර කිරීම සඳහාත්, වැඩසටහනේ ප්‍රතිලාභ ලබා ගැනීමට උනන්දු කිරීම සඳහාත් ඔවුන් දැනුවත් කිරීමේ අවශ්‍යතාවය තදින් ම අවධාරණය කර ඇත. තව ද කිරිවල ප්‍රමිතිය පිළිබඳ අවධානය යොමු කිරීම, වාර්තා තබා ගැනීම හා පෝෂණීය අරමුණු ඉටුවන පරිදි දරුවන් වෙත කිරි ලබාදීම වැනි කරුණු පිළිබඳ ව ද ඔවුන් දැනුවත් කිරීම අවශ්‍ය වේ.

මෙම වැඩසටහන තුළ අවම මට්ටමින් ක්‍රියාත්මක වන නමුත් අත්‍යාවශ්‍ය අංගයකි, අධීක්ෂණය. පාර්ශ්වකරුවන් ගණනාවක් හා කාර්යයන් සමූහයකින් සමන්විත "කිරි විදුරුව" වැඩසටහන

තුළ බොහෝ පියවරයන් හි දී අධීක්ෂණය වැදගත් වන අතර, එමගින් වැඩසටහන ඵලදායී හා කාර්යක්ෂම කරගැනීමට බොහෝ ඉඩකඩ ඇති බව පැහැදිලි ය.

## 9. නිගමන

01. වැඩසටහනක් පිළිබඳ ඇගයීමේ දී පළමුව එකී වැඩසටහනේ අවශ්‍යතාවය ඉස්මතු වූ ප්‍රතිපත්තිමය පදනම කෙතෙක් ප්‍රබල ද යන්න සලකා බැලීම ඉතා වැදගත් වේ. "කිරි වීදුරුව" වැඩසටහන මුල් ළමාවියේ මන්දපෝෂණය තුරන් කිරීම නම් වූ සමස්ත අරමුණ ඉටු කරගැනීම අරඹයා දියත් කරන ලද්දකි. එහි ඉලක්ක කණ්ඩායම දරුවන් ය. ඔවුන් වැඩිහිටියන් වන අනාගත සමාජයට පදනම සපයනු ඇත්තේ ළමා වියේ දී ගොනු කරගන්නා අත්දැකීම් ය. එය ඔපවත් කරනු ඇත්තේ ඔවුන්ගේ ළමා වියේ හුරුපුරුදු ය. නැවුම් කිරි පානය ළමා පරපුරට හුරු කිරීම තුළින් දේශීයත්වය අගයන නිරෝගී පරපුරක් බිහි කිරීමට හැකි වනු ඇත.

පසුගිය දශක කිහිපය තුළ දී ලෝකයේ සිදු වූ දේශපාලනික හා ආර්ථික පෙරළි හමුවේ නැවුම් කිරි පානය කිරීම ඇතුළු දේශීය ආහාර පුරුදු දරු පරපුරට දායාද කිරීම අප අතින් ගිලිහී ගිය වගකීම් ය. නැවුම් "කිරි වීදුරුව" පිටිකිරි හෝ කාබනීකෘත පානයන්ගෙන් ප්‍රතිස්ථාපනය විය. එසේ අතපසු වූ වගකීම්වල බැරෑරුම් බව අවු. 2-5 ත් අතර, දරුවන්ගෙන් 30% ක් පමණ මන්දපෝෂණයෙන් පෙළීම තුළින් ගම්‍ය වේ. මෙවැනි දුර්විපාක හමුවේ දරුවන්ගේ පෝෂණය, යහපත් ආහාර පුරුදු, දේශීය කර්මාන්තයක් ලෙස කිරි ගව කර්මාන්තයේ ප්‍රගතිය යනා දී කුමන දෘෂ්ටිකෝණයෙන් විග්‍රහ කළ ද "කිරි වීදුරුවේ" ප්‍රබල ප්‍රතිපත්තිමය පදනම එය අඛණ්ඩ ව ක්‍රියාත්මක කළ යුතු බව පසක් කර සිටී.

02. වැඩසටහන කෙසේ දියත් කර ඇත් ද? යන්න දෙවනුව වැදගත් වන කාරණය යි. වැඩසටහනක් සංකල්පමය වශයෙන් කෙතරම් ප්‍රබල වුව ද ඵලදායී හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක නො වන තැන අපේක්ෂිත අරමුණු ඉෂ්ඨ වීම යථාර්ථයක් වන්නේ නැත. "කිරි වීදුරුවේ" විවිධ පාර්ශවකරුවන්ගේ අත්දැකීම් හා නිරීක්ෂණ මත පදනම් වෙමින් සිදු කරන්නට යෙදුණු මෙම කඩිනම් ඇගයීමෙන් ගම්‍ය වන්නේ, "කිරි වීදුරුව" ස්ථානීය වශයෙන් සරල හෝ සංකීර්ණ වූත්, උපදෙස් පිළිපැදීම අතින් විෂම වූත්, කිරි බෙදාහැරීමේ ක්‍රියාවලිය ගැටලු හා දුෂ්කරතාවලින් ගහණ වූත් කර්තව්‍යයක් බව යි.

03. තෙවනුව, වැඩසටහන දියත් කිරීම තුළින් අපේක්ෂිත අරමුණු කෙතෙක් ඉටු වී ඇත් ද? යන කරුණ වැදගත් වේ. "කිරි වීදුරුව" මෙතෙක් අත්පත් කරගත් ප්‍රතිඵලවලින් ගම්‍ය වන පරිදි, අපේක්ෂිත කෙටිකාලීන හා ආසන්නතම අරමුණ කරා ළඟා වීම ප්‍රමාණාත්මක ව ප්‍රතිශතයක් වශයෙන් 45% කි. නියමිත වේලාවට කිරි ලබාදීම, නියමිත දින ගණන හා නියමිත කිරි මාත්‍රාව සෞඛ්‍යාරක්ෂිත ව ලබා දීම යනා දී කරුණු අතින් "කිරි වීදුරුව" සැලකිය යුතු ගුණාත්මක වර්ධනයක් අත්පත් කරගත යුතු ව ඇත. එතමුදු දැයේ දරුවන් පෝෂණය කළ "කිරි වීදුරුව" බොහෝ ප්‍රායෝගික දුෂ්කරතා හමුවේ ලබා ඇති සාර්ථකත්වය අගය කළ යුතු ය. ඊට කැප වූ ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමේ නිලධාරීන් මෙන් ම කිරි ගොවීන් හා බෙදාහරින්නන් දිරිමත් කිරීම අවශ්‍ය වේ. තව ද සංකල්පමය වශයෙන් බලවත් වූ මෙන් ම අවශ්‍යතාවය අතින් බරපතල වූ මෙම වැඩසටහන ප්‍රායෝගික අකාර්යක්ෂමතාව හමුවේ ලඝු කොට, අතහැරිය යුතු හෝ අතපසු කළ යුතු වගකීමක් නො වේ. නැවුම් එළකිරි, පෝෂණ වැඩසටහනක් දියත් කිරීම සඳහා

ආහාර ද්‍රව්‍යයක් වශයෙන් බෙහෙවින් උචිත ය. වැඩසටහනට ප්‍රමාණවත් යෙදවුම්, කාර්ය මණ්ඩල හා අනෙකුත් සම්පත් ඇත. අවශ්‍ය වන්නේ නිසි පරිදි සම්පත් කළමනාකරණය කිරීම හා සම්බන්ධීකරණය කිරීම තුළින් වැඩසටහන අඛණ්ඩ ව දියත් කිරීම පමණි.

04. කෙසේ වෙතත් කිසියම් වැඩසටහනක "පරිපූර්ණ" බව සාපේක්ෂ ය. එබැවින් "කිරි විදුරුව" සාර්ථක ද අසාර්ථක ද යන්න පිළිබඳ තීන්දුවකට එළඹීමට වඩා වැදගත් වන්නේ, පවතින තත්ත්වයෙන් එය ඔසවා තැබිය හැක්කේ කෙසේ ද? යන්න අවධාරණය කිරීම යි. එය කළ හැක්කේ කෙසේ ද? මේ පිළිබඳ නිගමනයකට එළඹීමේ දී වඩාත් සුපරීක්ෂාකාරී විය යුතු ය. ඒ මන්ද යත්, මෙතෙක් දුරට වැඩසටහන ඉදිරියට රැගෙන ආ පාර්ශවයන් ප්‍රතිපත්තිමය තීරණ තුළින් අධෛර්යමත් නො කළ යුතු බැවිනි. දැනටමත් ව්‍යාපෘතිය දියත් කළ සමහර ප්‍රදේශවලින් වාර්තා වන පරිදි වරින්වර සිදු කරන්නට යෙදුණු ප්‍රතිපත්තිමය විචලතා වැඩසටහනේ පාර්ශවකරුවන් අධෛර්යමත් කිරීමට හේතු වී ඇත. එමෙන් ම සන්නිවේදන දුර්වලතාවයන් හේතුවෙන් වැඩසටහනේ අඛණ්ඩභාවය පිළිබඳ අවිනිශ්චිතතාවයක් වර්ධනය වී ඇත. එබැවින් මෙම වැඩසටහනෙන් අපේක්ෂිත ප්‍රතිඵල අත්පත් කරගැනීම උදෙසා පහත සඳහන් නිර්දේශයන් ඉදිරිපත් කරනු ලැබේ.

## 10. නිර්දේශ

### 10.1 ක්‍රියාත්මක වැඩපිළිවෙළ

01. වත්මන් වැඩපිළිවෙළ සාර්ථක ව දියත් කරන ප්‍රදේශවල ගැටලු/දුෂ්කරතා/අක්‍රමිකතා නිරාකරණය කරගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දී වැඩසටහන අඛණ්ඩ ව දියත් කිරීමට දිරිගැන්වීම.

02. කිරි බෙදාහැරීම ආයතනගත කිරීමට උචිත ක්‍රියාත්මක වැඩපිළිවෙළක් හඳුන්වා දී එය මෙතෙක් ක්‍රියාත්මක නොවූ වසම්වල නියමු මට්ටමෙන් ක්‍රියාත්මක කර, එහි සාර්ථකත්වය මත වෙනත් ප්‍රදේශවලට ව්‍යාප්ත කිරීම. උදා. පෙර පාසල් හරහා වැඩසටහන ක්‍රියාත්මක කිරීම (මෙම ක්‍රමයේ වාසි පිළිබඳ ව ඇමුණුම 1 න් ඉදිරිපත් කර ඇත).

03. ප්‍රදේශීය මට්ටමේ කාර්ය මණ්ඩලයේ අභිමතය පරිදි දැනට වැඩසටහන ක්‍රියාත්මක කරන ප්‍රදේශවල ක්‍රියාත්මක වැඩසටහන ඉහත දෙවැන්නෙන් ප්‍රතිෂ්ඨාපනය කිරීමට ඉඩප්‍රස්ථා සැලසීම.

04. වැඩසටහන වෙත පශු පාලනය හා සෞඛ්‍ය හා පෝෂණ අංශවලට අදාළ රේඛීය ආයතනවල ඉහළ දායකත්වයක් ලබා ගැනීම තුළින් වැඩි ප්‍රමිතියකින් යුත් කිරි සෞඛ්‍යාරක්ෂිත ව සැපයීම සඳහා පියවර ගැනීම.

### 10.2 කිරි ගොවීන් දිරි ගැන්වීම

01. ජාතිය ගොඩනැඟීමේ හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය හරහා කිරි විදුරුවට සම්බන්ධ කිරි ගොවීන් තගා සිටුවීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.

02. කිරි මිල ඉහළ නැංවීම තුළින් වැඩසටහන දියත් කිරීමේ වගකීම දරන ළමා ලේකම් කාර්යාලය කිරි ගොවීන් දිරිගැන්වීමට සෘජු ව මැදිහත් වීම.

03. දැනට වැඩසටහනට දායක වී ඇති කිරි ගොවීන් වෙත සත්ව නිෂ්පාදන අංශයේ ව්‍යාප්ති හා පුහුණු සේවාවන් කාර්යක්ෂම ව සැපයීම.

## 10.3 දැනුවත් කිරීම

01. සියලු පාර්ශවයන් දැනුවත් කිරීම හා දුර්මත දුරු කිරීම සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මෙන් ම දේශපාලන වේදිකා ප්‍රයෝජනයට ගැනීම.

02. වැඩසටහන පිළිබඳ දැනුම හා අත්දැකීම් හුවමාරු කරගැනීමට හා නිලධාරීන් දිරිගැන්වීම සඳහා "කිරි විදුරුවේ" අධීක්ෂණ හා විෂයබාර නිලධාරීන් පුහුණු වැඩසටහන්වලට සහභාගි කරවීම.

03. ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් වැඩසටහන දියත් කිරීම පිළිබඳ තරඟකාරිත්වයක් ඇති කර, එය ඵලදායී ලෙස ඉදිරියට ගෙන යාම.

## 10.4 අධීක්ෂණය හා ප්‍රගති සමාලෝචනය

01. දිනපතා නියමිත කිරි මාත්‍රාව සෞඛ්‍යාරක්ෂිතව ලබා දීමේ අවශ්‍යතාවය දැඩි ලෙස නිර්දේශ කිරීම හා එහි ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම.

02. අධීක්ෂණය ක්‍රමවත් කිරීම හා ප්‍රගති සමාලෝචනයට උචිත වැඩපිළිවෙළක් යෙදීම තුළින් වැඩසටහනේ කෙටිකාලීන හා දිගුකාලීන අරමුණු ඉටුවීම පිළිබඳ ව ජාතික මට්ටමේ ඇගයීමකට ලක් කිරීම.

## 10.5 පරිපාලනමය වශයෙන් පැන නැඟී ඇති ගැටලු නිරාකරණය කිරීම

01. විවිධ පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කරන ලද ගැටලු නිරාකරණය කිරීම සඳහා පරිපාලනමය වශයෙන් මැදිහත් වීම.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. මහින්ද චින්තන, (2006).

2. ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය, (2009). චක්‍රලේඛ අංක 2009/1.

3. Hitihamu, H.M.S.J.M, and Epasinghe, S. (2009). Mid-term Evaluation of Dairy Village Development Project. Hector Kobbekaduwa Agrarian Research and Training Institute, Colombo 07.

4. Michael, Griffin (2005). Overview of Worldwide School Milk Programmes. Paper presented at 3rd International School Milk Conference. Kunming China, 11-14 April, 2005.

ඇමුණුම අංක 1

## පෙර පාසල් හරහා "කිරි විදුරුව" දියත් කිරීමේ වාසි සහ අවාසි

### වාසි

01. වත්මන් වැඩසටහනේ ප්‍රධානතම ගැටලුව වන, බෙදාහැරීමේ දුෂ්කරතා අවම වීම.
02. වයස පිළිබඳ තීරණායකය නිසා වැඩසටහනට සම්බන්ධ වීමේ ප්‍රමාදවීම් හා පාසල් යාමට පෙර වයස මාස 60 ඉක්ම වූ විගස ම දරුවන්ට ප්‍රතිලාභ අහිමි වීම නිසා ඇති වන මානසික පසුබෑම් වළක්වා ගත හැකි වීම.
03. අධීක්ෂණයේ අපහසු ම කොටස වන, දරුවන් නියමිත වේලාවට, නියමිත කිරි මාත්‍රාව පානය කිරීම අධීක්ෂණය කිරීමේ වගකීම පෙර පාසල් පාලිකාවට පැවරිය හැකි වීම.
04. ප්‍රමිතිය හා සෞඛ්‍යාරක්ෂිත බව පරීක්ෂා කිරීම පහසු වීම.
05. දරුවන් දිනපතා පෙර පාසල් පැමිණීම සඳහා අභිප්‍රේරණය වීම.
06. අධීක්ෂණය තුළින් අක්‍රමිකතා අවම කළ හැකි වීම හා ප්‍රගති සමාලෝචනය පහසු වීම.
07. පූර්ව ළමාවිය සංවර්ධන ආයතනවල සෞඛ්‍ය හා පෝෂණ කරුණු වැඩිපුර අන්තර්ගත වීම හා ඒකාබද්ධ වැඩසටහන් දියත් කිරීමට ඉඩ ප්‍රස්ථා ඇති වීම.
08. අමතර ආදායමක් ලැබීමේ අවස්ථාව ලබා දීම තුළින් පෙර පාසල් දිරිගැන්වීම.
09. දෙමාපියන් දරුවන්ගේ පෝෂණය පිළිබඳ දැනුවත් වීම හා එමගින් නියමිත වයසේ දී දරුවන් පෙර පාසලට ඇතුළත් කිරීමට අභිප්‍රේරණය වීම.
10. අඩු වයස් කාණ්ඩවල දරුවන් වෙත පෙර පාසල හරහා සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන් දියත් කිරීමේ හැකියාව පරීක්ෂා කළ හැකි වීම.
11. විෂයබාර නිලධාරීන්ගේ (පූර්ව ළමාවිය සංවර්ධන සහකාර) වගකීම් ඉටු කිරීම පහසු වීම හා ඔවුන්ට ඒකාබද්ධ වැඩපිළිවෙළක් දියත් කළ හැකි වීම.
12. ඉදිරියේ දී ක්‍රියාත්මක වීමට නියමිත ප්‍රතිඵල පාදක ඇගයුම් ක්‍රමවේදය සඳහා උචිත වීම.

### අවාසි

01. දරුවන් ප්‍රතිලාභ ලබන අවම වයස මාස 36 සිට 47 දක්වා ද, උපරිම වයස මාස 60 සිට 71 දක්වා ද වෙනස් වේ. එම නිසා වයස පිළිබඳ වත්මන් තීරණායක ප්‍රායෝගික නොවේ.
02. ආදායම් මට්ටම අනුව දරුවන් වෙන් කළ නො හැකි වීම.
03. කිරි ලබාදීමට හැකි දින ගණන අඩු වීම (20-21).